1860

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ..........................................................................................  විභාග අංකය :- ..............................

සැලකිය යුතුයි:

- පළමු කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- දෙවන කොටසට අදාළ පිළිතුරු ලියා පළමු කොටසට අමුණා බාර දෙන්න.

## I කොටස

- අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ජන සමාජයේ කුඩා ම සමාජ ඒකකය වන්නේ,
(1) ග්‍රාම නිලධාරී වසම වේ. (2) නගරය වේ.
(3) පවුල වේ. (4) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වේ.

(02) ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා තමන් තුළ පිහිටුවා ගන්නා නිශ්චිත නිවැරදි අධිෂ්ඨානයන්
(1) ජීවන අරමුණු ලෙස හඳුන්වයි. (2) ජීවන ආකල්ප ලෙස හඳුන්වයි.
(3) ජීවන අත්දැකීම් ලෙස හඳුන්වයි. (4) ජීවන පැවැත්ම ලෙස හඳුන්වයි.

(03) ජීව විද්‍යාත්මක පරීක්ෂණයක් වන DNA පරීක්ෂණයෙන් අනාවරණය වන්නේ,
(1) පුද්ගලයෙකුගේ ගති ලක්ෂණ පිළිබඳව ය.
(2) පුද්ගලයෙකුගේ හැසිරීම් රටාව පිළිබඳව ය.
(3) පුද්ගලයෙකුගේ ශාරීරික අනන්‍යතාවය පිළිබඳව ය.
(4) පුද්ගලයෙකුගේ ශක්තිමත්භාවය පිළිබඳව ය.

(04) ගුරුන් ගුණ මහත ය
දෙගුරුන් ගුණ ද මහත ය
මෙකී ගුණ මහත ය
සැලකූ අයහට මහත් සැපත ය
ඉහත සඳහන් කවිය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,
(1) බුදුගුණ අලංකාරයයි. (2) ලෝවැඩ සඟරාවයි.
(3) සුභාෂිතයයි. (4) සිරිත් මල්දමයි.

(05) වර්තමාන සමාජයේ පවුල් ඒකකයක් සාමාන්‍යයෙන් මුහුණපාන අභියෝගයකි.
(1) දෙමව්පියන් රැකියාවල හෝ විදේශ රැකියාවල නිරත වීම
(2) කාර්ය බහුල නොවීම.
(3) ජීවත්වීමට ප්‍රමාණවත් ආදායමක් ලැබීම.
(4) දරුවන්ට ආදරය ආරක්ෂාව උපරිමයෙන් ලැබීම.

193

- අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(06) සමාජයෙන් සමාජයට සංස්කෘතික ලක්‍ෂණ වෙනස් විය හැකි ය. ( )

(07) අප රටේ ජාතික කොඩිය වෙනත් රටවල ජාතික කොඩි සමඟ එසවීමේ දී සමාන උසකින් ( )
තැබිය යුතුවේ.

(08) පුද්ගලයෙකුගේ ගුණාංග එම පුද්ගලයාගේ සාර්ථකත්වයට හේතු නොවේ. ( )

(09) භාණ්ඩවල මිල දර්ශනයන් වෙළඳසැල්වල ප්‍රදර්ශනය කිරීම අත්‍යවශ්‍ය නොවේ. ( )

(10) ඔබගේ මවගේ අයියාගේ හෝ මල්ලීගේ පුතා මස්සිනා වේ. ( )

- අංක 11 සිට 15 දක්වා වූ ප්‍රශ්න සඳහා වරහන තුළ දී ඇති වචන යොදා හිස්තැන් පුරවන්න.

( චිත්තවේග , ක්‍රියාපිළිවෙත් , සංකීර්ණ , අයිතිවාසිකම් , සාර්ථකත්වය , නීති රීති )

(11) ළමයින් සහ වැඩිහිටියන් ආරක්‍ෂා කිරීම සඳහා සෑම රටකම ................................ පද්ධතියක් අනුගමනය කරනු ලැබේ.

(12) යහපත් වූ ජීවිතයක් ගත කිරීම සඳහා පවුලෙන් ලැබෙන හිමිකම ................................ ලෙස හැඳින්විය හැකි ය.

(13) පුද්ගලයින් මුහුණපාන විවිධ අවස්ථාවන්ට සම්බන්ධව සිත තුළ ජනිත වන සිතුවිලි, හැඟීම් ................................ ලෙස හැඳින්වේ.

(14) ආගමික ආයතන මඟින් අපගේ ජීවිත ................................ සඳහා ඉතා වැදගත් වූ මෙහෙයක් ඉටුකරනු ලබයි.

(15) මිනිස් ජන සමාජය ඉතා සරල මට්ටමකින් ආරම්භ වී ................................ ස්වභාවයකට වර්තමානයේ පත්ව ඇත.

- අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.

(16) ඔබට ලැබෙන විවේක කාලය ................................ ලෙස ගත කිරීමට හුරුපුරුදු වීම ඔබේ යහපතට හේතු වේ.

(17) වර්තමානයේ ලොව බොහෝ රාජ්‍ය බහු ................................ සමාජ වේ.

(18) මව, පියා සහ දරුවන් පමණක් එකට ජීවත්වන පවුල ................................ පවුල් ඒකක ලෙස හඳුන්වයි.

(19) අපේ රටේ ජාතික ක්‍රීඩාව ................................ වේ.

(20) පරාක්‍රම සමුද්‍රය ................................ රාජධානිය සමයේ ඉදිවූවකි.

(ලකුණු 20 x 2 = 40)

194

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) (1) පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) ඔබට පහසුවෙන් යෙදිය හැකි සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(3) පාසල් ශිෂ්‍යයෙකු ලෙස ඔබ තුළ තිබිය යුතු අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(4) කලණ මිතුරකු තුළ දක්නට ලැබෙන යහපත් ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 02)

(5) එදිනෙදා අප තොරතුරු ලබාගන්නා මාධ්‍යයන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(6) යහපත් පුරවැසියෙකු සතු උතුම් ගුණාංග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(7) ශ්‍රී ලාංකික ජන සමාජයේ ජීවත්වන ජන වර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

(8) අප රටේ භාවිත වන ප්‍රධාන භාෂා දෙක නම් කරන්න. (ලකුණු 02)

(02) (1) පවුලේ සාමාජිකයෙක් ලෙස ජීවත් වීම නිසා අත්වන ප්‍රයෝජන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) සමාජයේ යහපතට හේතුවන වෙනත් ආයතන හතරකට උදාහරණ දෙන්න. (ලකුණු 04)

(3) ඔබ අගය කරන ආදර්ශවත් පුද්ගලයින් තිදෙනෙක් නම් කර ඉන් එක් අයෙකු සතු උසස් ගති ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 05)

(03) (1) ඇසුරුම් සහිත නිෂ්පාදන මිල දී ගැනීමේ දී නිෂ්පාදනවල අනිවාර්යයෙන් මුද්‍රණය කර තිබිය යුතු දේවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) ඖෂධ වර්ග මිල දී ගැනීමේ දී හා භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) වර්තමාන සමාජයේ බොහෝ සාමාජිකයින් මුහුණ දෙන අභියෝගාත්මක අවස්ථා පහක් නම් කරන්න. (ලකුණු 05)

(04) (1) වයස අවුරුදු 14ට අඩු දරුවන් රැකියාවල යෙදවීමට බලපාන හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ සේවයේ නිරත වී සිට විශ්‍රාම ගත් පුද්ගලයෙකුට විශ්‍රාම දිවිය ඵලදායීව ගත කළ හැකි ආකාර හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) ජන සමාජයේ පුද්ගලයින් තම යුතුකම් හා වගකීම් මනාව ඉටු කිරීම නිසා සමාජයට වන යහපත පිළිබඳව වාක්‍ය පහක් ලියන්න. (ලකුණු 05)

(05) (1) දෙමාපියන් වෙනුවෙන් දරුවන් විසින් ඉටුකළ යුතු යුතුකම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) (a) ආචාරශීලීව භාෂාව භාවිතයෙන් ලැබෙන යහපත් ප්‍රතිඵල දෙකක් ලියන්න. (ලකුණු 02)

(b) ආචාරශීලීබවෙන් තොරව භාෂාව භාවිතා කිරීමෙන් අත්වන අයහපත් ප්‍රතිඵල දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(3) ආගමික සංවිධාන හා සම්බන්ධව කටයුතු කිරීම මගින් ඔබට ලැබෙන ප්‍රයෝජන පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

195

The National e-learning Portal for General Education

(06) (1) සංස්කෘතික අංග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) පහත විවිධ උත්සව කුමන, ආගමකට අයත්දැයි A, B, C, D අනුපිළිවෙළින් ලියන්න.

A ඇසළ    B පාස්කු

C හජ්ජි    D තෛපොංගල්

(3) සංස්කෘතික දායාද ආරක්ෂා කිරීම අතිශය වැදගත් වන්නේ ඇයිදැයි ඔබේ අදහස් වාක්‍යය පහකින් ලියන්න. (ලකුණු 05)

(07) (1) ජාතික අනන්‍යතාවයේ පහත සංකේත වල නිර්මාතෘවරයා ලෙස කටයුතු කළ පුද්ගලයින් A, B පිළිවෙලින් නම් කරන්න.

A ජාතික ගීය

B රාජ්‍ය ලාංඡනය (ලකුණු 02)

(2) ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය ලෙස නා ගස තෝරා ගැනීමට බලපෑ හේතු හතරක් ලියන්න. (ලකුණු 04)

(3) ජාතික කොඩිය භාවිතයේ දී අප විසින් අනුගමනය නොකළ යුතු දේවල් පහක් සඳහන් කරන්න. (ලකුණු 05)